ශ්‍රී ලංකා කලා මණ්ඩලයේ

# කලා සඟරාව

සංස්කාරකවරු:
තෙරිපැහැ සෝමානන්ද
ආනන්ද කුලසූරිය
ඩී. එම්. ගුණරත්න

39 වන
කලාපය
1991 දෙසැම්බර

# මොහෙන්ජෝදරෝවෙන් හමු වූ මුද්‍රාවල දැක්වෙන සත්ව සහ මිනිස් රූප පිළිබඳ විශ්ලේෂණයක් - II

අනුර මනතුංග

**ගිය කලඹින් ඉතිරිය :**

**සටන් ජවනිකා (Contest Motifs)**

මිනිසෙකු සහ සතෙකු අතර සටනක් දැක්වෙන මුද්‍රා කීපයක් ම මොහෙන්ජෝදරෝවෙන් හමුවී ඇත. මෙම මුද්‍රාවල දැක්වෙන බොහෝ රූප සංයුක්ත රූප බව පැහැදිලිය. මේවා අතර වඩාත් සුලබ විරුද්ධවාදීන් ලෙස දක්නට ඇත්තේ අං සහිත මිනිසෙකු සහ අං සහිත කොටියෙකු ය. ඒ හැරුණු විට මිනිසා සහ මීහරකාත් මිනිසුන් සහ මිනිසුනුත්, සතුන් සහ සතුන් අතර ඇතිවන සටන් ද මේ මුද්‍රාවල දුටුව හැකිය. මැදපෙරදිගින් හමු වූ සමකාලීන කලාකෘති සමග හරප්පන් ශිෂ්ටාචාරයේ මේ මුද්‍රාවල සමීප සම්බන්ධතාවයක් ඇත.[49]

**කොටියා සහ මිනිසා (Tiger and Man)**

මිනිසෙක් කොටියෙකු සමඟ සටන් කරන හෝ මිනිසෙක් කොටියෙකුට අභියෝග කිරීම දැක්වෙ-තැයි සිතිය හැකි ජවනිකා කීපයක් ම මොහෙන්ජෝ දරෝ මුද්‍රාවල දුටුව හැකිය. මේ අතරින් එක් ජනප්‍රිය ජවනිකාවක් වන්නේ මිනිසෙකු විසින් කොටියන් දෙදෙනෙකුගේ ගෙළ මිරිකාගෙන සිටින ආකාරය ය.[50] ඒවායේ දැක්වෙන මිනිසා දෙපස තරමක් ඇත් කොට සිටගෙන සිටින අතර වැළමිට ළඟින් තරමක් නවාගත් දෙඅතින් දෙපස සිටින කොටියන් දෙදෙනාගේ ගෙළ දැඩිව අල්ලා ගෙන ඇත. කොටියන් දෙදෙනා සිටින්නේ පසුපස දෙපයින් සිටගෙන ඉදිරි දෙපය මිනිසා දෙසට විහිද ගෙනය. මිනිසා ගෙළ දකුණු පසට හරවා එදෙසින් සිටින විශාල කොටියා දෙස නෙත් යොමා ඇත. සම්පූර්ණ නිරුවතින් සිටින මේ මිනිසාගේ ලිංගේන්ද්‍රිය ද හඳුනාගත හැකි අතර හිස මත තිත් හයක් දක්නට ලැබීම විශේෂතාවයක් ලෙස දැක්විය හැකිය.

මේ ජවනිකාවට සමාන ජවනිකා දැක්වෙන රූකම් රැසක් සුමේරියාවෙන් සහ ඊලාම්වලින් හමුවී ඇත. ඒ අතර නිපූර්හි ඉනාම් දෙවොලින් ලැබුණු රූකම් ඵලකය විශේෂයෙන් දැක්විය හැකිය.[51] එහි ඇති ඉහත දැක්වූ ජවනිකාවට බෙහෙවින් සමාන ජවනිකාව හැරුණු විට ඊට පහතින් ගසක් දෙපසින් සිටින හරප්පන් වර්ගයේ යුනිකෝන් ගවයන් දෙදෙනෙකුගේ රූපයක් ද ඇත.

මුල් රාජවංශ යුගයේ සහ ඉන් ඉදිරි කාලයට අයත් කලාකෘතිවල ගවයන් දෙදෙනෙකු හෝ සිංහයන් දෙදෙනෙකු හෝ නාගයන් දෙදෙනෙකු මෙලෙස අල්ලා ගෙන සිටින මිනිසෙකුගේ රූපය සුලබව දක්නට ලැබේ.[52] මෙවැනි රූප අතර සිටින මෙසපොතේමියානු වීරයාගේ හිස මත 'කැරලි' හයක් දක්නට ලැබීම මොහෙන්ජෝදරෝ මුද්‍රාවේ ඇති තිත් හය සිහිපත් කරවන සුළුය.

මොහෙන්ජෝදරෝවෙන් ලැබුණු තවත් මුද්‍රා කීපයක ගවයෙකුගේ අංග සමඟ සංයුක්ත වූ කොටියෙකු සහ ස්ත්‍රියක අතර සටනක් දුටුව හැකිය.[53] මෙහි දැක්වෙන ස්ත්‍රියට අං තට්ටුවක් සහ වලිගයක් ඇති අතර දෙපයේ පහත කොටස් සහ අත්ල ගවයෙකුගේ පාදවල පහත කොටස් වැනිය. ගසක් ඉදිරියේ සිටගෙන සිටින ඇය අං